

අපගේ ශාසතෘන් වහන්සේ වන

ගෞතම සම්මා සම්බුදු රජාණන් වහන්සේ විසින් වදාළ පිරිසිදු ශ්‍රී සද්ධර්මය ඇතුළත්

## සූත්‍ර පිටකයේ

## ඛුද්දක නිකායෙ හි ඇතුළත් සුත්ත නිපාතයේ අඞංගු

# විජය සූත්‍රය

(මෙහි ඇතුළු පිටුවල මළ සිරුරු වල, අසුභ කොටස් වල සහ ශරීර අභ්‍යන්තරයේ රූපරාමු ඇතුළත් බව කරුණාවෙන් සළකන්න.)

චරං වා යදි වා තිට්ඨං
නිසින්නෝ උද වා සයං
සම්මිංජේති පසාරේති
ඒසා කායස්ස ඉංජනා




යන විට හිඳින විට සැතපී සිටින විට
අත් පා දිග හරින විට හකුළුවන විට
දත යුතුය මෙය සොඳිනේ චලනය පමණි සරුරේ

**අට්ඨී නහාරු සංයුත්තෝ තච මංසාවලේපනෝ**

**ඡවියා කායෝ පටිච්ඡන්නෝ යථා භූතං න දිස්සති**



**ඇට නහරින් යුතුව සම් මස් එහි ගෙතුව**

**සිවියෙන් වැසුණු කය ලොව ඇති තතු වැසුව**



අනුතපූරෝ උදරපූරෝ යකපේළස්ස වත්ථිනෝ

හදයස්ස පප්ඵාසස්ස වක්කස්ස පිහකස්ස ච



වැළඳූ බොජුන් පිරී බඩ වැල් පිරුණු කය

හදවත අක්මාව හා ඇති වකුගඩු ය

කැවුතු මස පිරුණු බඩ දිව ද මෙහි රැඳුණු



සිංඝාණිකාය ඛේළස්ස සේදස්ස මේදස්ස ච
ලෝහිතස්ස ලසිකාය පිත්තස්ස ච වසාය ච





සොටු කෙළ ඩහදිය ද ගලනා මේද තෙල
ලේ සඳ මිදුළු පිත හා යුතු වුරුණු තෙල

**අත්ථස්ස නවහි සෝතේහි අසුචි සවති සබ්බදා**

**අක්ඛිම්හා අක්ඛිගූථකෝ කණ්ණම්හා කණ්ණගූථකෝ**





**දොර නවයකින් ගලන අසූචිය මෙහි සැමදා**

**ඇස පිරි කබ ද කණ කාරළු එයි නිබඳා**

සිංඝාණිකා ච නාසාතෝ මුඛේන වමතේ'කදා

පිත්තං සෙම්හං ච වමති කායම්හා සේදජල්ලිකා





නැහැයෙන් සොටු ගලන මුඛයෙන් පිත සෙම ද

සිරුරෙන් වැගිරේ ය ඩහදිය හා දැලි ද

## අට්ඨස්ස සුසිරං සීසං මත්ථලුංගස්ස පූරිතං
## සුභතෝ නං මඤ්ඤති බාලෝ අවිජ්ජාය පුරක්ඛතෝ



## හිස මොළ පිරුණු කබළකි හිස ඇති සිදුරෑ
## සොඳුරුව පෙනේ නැණ නැති පිරිසට අඳුරෑ

යදා ච සෝ මතෝ සේති උද්ධුමාතෝ විනීලකෝ

අපවිද්ධෝ සුසානස්මිං අනපෙක්ඛා හොන්ති ඤාතයෝ




මළ පසු යම් දිනක ඉදිමී නිල් වීමෙන්

අත් හැර දමති නෑසියෝ සොහොනේ ලෑමෙන්

## ඛාදන්ති නං සුවාණා ච සිඟාලා ච වකා කිමී
## කාකා ගිජ්ඣා ච ඛාදන්ති යේ චඤ්ඤේ සන්ති පාණිනෝ



## කති එය සිවල්ලු ද වෘකයන් හා පණුවෝ
## ලිහිණි ද කවුඩු වෙත මළකුණ බත සැදුවෝ

**සුත්වාන බුද්ධ වචනං භික්ඛු පඤ්ඤානවා ඉධ**

**සෝ බෝ නං පරිජානාති යථා භූතං හි පස්සති**



**බුදු බණ අසන නුවණැති සමණාන් ට මෙය**

**ඇති තතු දකින කමටහනකි වඩති එය**

යථා ඉදං තථා ඒතං යථා ඒතං තථා ඉදං
අජ්ඣත්තං ච බහිද්ධා ච කායේ ඡන්දං විරාජයේ



තම කය යම් සේ ද මළකුණ එලෙසේ ය
මළකුණ යම් සේ ද තම කය එලෙසේ ය
ඇතුළත පිටත සිරුරේ ඡන්ද රාගය
දුරු කර දමයි හේ එය වඩන සෝකය

**ඡන්දරාගෝ විරත්තෝ සෝ භික්ඛු පඤ්ඤාණවා ඉධ**

**අජ්ඣගා අමතං සන්තිං නිබ්බාණ පද මච්චුතං**



**දුරු කොට ඡන්ද රාගය නුවණැති සමණා**

**පැමිණේ නිවන් සැපයට අම සුව ලැබෙනා**

දිපාදකෝ යං අසූචි දුග්ගන්ධෝ පරිහීරති
නා නා කුණප පරිපූරෝ විස්සවන්තෝ තතෝ තතෝ



දුගඳින් පිරි අසූචි පිරි මේ කය නිතොර
වැගිරේ තැනින් තැන අසූචි ම වී නොතොර

**ඒතාදිසාන කායේන යෝ මඤ්ඤේ උණ්ණමේතවේ**

**පරං වා අවජානෙය්‍යය කිමඤ්ඤත්‍ර අදස්සනා ති**



**මෙලෙසින් යුතු කයක් දරමින් හිතට ගෙන**

**උස්කොට තමා දක්වන ඉහළින් සිතන**

**අන් හැම පහත් කොට පහළට ඇද දමන**

**මොහු වෙන කවරෙක් ද ලෝ තතු නොම දකින**



# තෙරුවන් සරණයි !